


# සිංහල සිනමාවේ හැට වසර

## ආපසු හැරී බැලීමක්



ශ්‍රීනාත් මද්දුමගේ

මෙයට වසර හැටකට ප්‍රථම 1947 ජනවාරි 21 වන දා තිරගත වුණ කඩවුණ පොරොන්දුව සමගින් සිංහල චිත්‍රපට කලාවක් බිහිවුණි. එයට ප්‍රථම ශ්‍රී ලංකාව තුළ තිරගත වූයේ විදේශීය චිත්‍රපට යි. මේ යුගයේ දී බටහිර චිත්‍රපට වලට වඩා වැඩි ප්‍රමාණයක් තිරගත වූයේ දකුණු ඉන්දියානු ද්‍රවිඩ චිත්‍රපට හා හින්දි චිත්‍රපටයි. අතරින් පතර බටහිර



රේඛාව 1956

චිත්‍රපට කීපයක් තිරගතවුණි.

මේ වන විට සිංහල ප්‍රේක්ෂකයන්ට චිත්‍රපටය අරුමයක් නොවී ය. හින්දි හා ද්‍රවිඩ චිත්‍රපට නරඹා හෙම්බත්ව සිටි ප්‍රේක්ෂකයන්ට සිංහල නලු නිළියන් රඟපාන සිංහල ගීත හා දෙබස් සහිත චිත්‍රපට අවශ්‍ය විය. මෙය තේරුම් ගත් විදේශීය චිත්‍රපට කරුවන් සිංහල චිත්‍රපට කලාවක් බිහි කිරීමට උත්සාහ කළ නමුත් මේ වන විට විදේශ චිත්‍රපට සමාගම් වල තිබූ තරගය නිසා ඔවුනට නිහඬ වන්නට සිදුවිය. මෙයින් ප්‍රයෝජන ගත් අපේ සිංහල නාට්‍ය අධ්‍යක්ෂවරු කීපදෙනෙක් මේ කාර්යයට උරදුන්හ. එයින් බී ඒ ඩබ් ජයමාන්න ශාන්ති කුමාර් සිරිසේන විමලවීර විලී ජයමාන්න වැනි ප්‍රවීණ නාට්‍ය වේදීන් සිංහල චිත්‍රපට කලාවක් බිහි කිරීමට උත්සාහ කළෝ ය. නමුත් ඔවුනට ආර්ථික දුස්කරතා රාශියකට මුහුණ දීමට සිදුවිය. මේ අවස්ථාවේ දී දකුණු ඉන්දිය චිත්‍රපට නිෂ්පාදක වරු මොවුනට උදව් කිරීමට ඉදිරිපත් වූහ.

ඒ අනුව 1947 කඩවුණ පොරොන්දුවත් 1947 අසෝකමාලා චිත්‍රපටයත් නිෂ්පාදනය විය. කඩවුණ පොරොන්දුව ඇස් ඇම් නායගම් මහතාත් අසෝකමාලා චිත්‍රපටය සර් චිත්තම්පලම් ගාඩිනර් මහතාන් නිෂ්පාදනය කළ හ.

එසේ වුවද මේ සියලු චිත්‍රපට රූ ගත කෙරුණේ ඉන්දීය කාර්මික ශිල්පීන් අතිනි. ඉන්දියාවේ රූප ගත කොට මෙරටට ගෙන්වා ප්‍රදර්ශණය කෙරුණ මේ චිත්‍රපට වල සිංහල දෙබස් තිබුණ ද සමස්ත වශයෙන් පෙනුණේ දකුණු ඉන්දියානු ගතියකි. එසේ තිබියදී සිරිසේන විමලවීර මහතා ඔහුගේ සිංහල නාට්‍ය චිත්‍රපට වලට නැගීම ඇරඹුවේ ය. කැලෑ හඳ චිත්‍රපටය දකුණු ඉන්දියානු සිනමාවෙන් මිදී රූ ගත කෙරුණු චිත්‍රපටයකි. එපමණක් නොව ශ්‍රී ලාංකිකයෙකු අතින් බිහිවුණ ප්‍රථම චිත්‍රාගාරය නව ජීවන චිත්‍රාගාරය නමින් බිහි කරන්නට ද ඔහු සමත් විය. ඒ වන විට චිත්‍රාගාර කීපයක් ලංකාවේ ස්ථාපිත වී තිබුණ ද ඒ සියල්ලේම අයිති කරුවන් වූයේ විදේශිකයන් ය.

1955 දී ද සිරිසේන විමලවීර මහතා පොඩි පුතා චිත්‍රපටය නිපදවීමෙන් ප්‍රේක්ෂක ගෞරවයට පාත්‍ර විය. මේ අවදිය වන විට සිංහල නිෂ්පාදකයන් එකිනෙකා නැගී එන විට කේ ගුණරත්නම් මහතා නැවත වරක්



ලෙස්ටර්

දකුණු ඉන්දියානු මළකඩ කෑ දෙමළ සංස්කෘතිය සිංහල චිත්‍රපටයට බෝ කරමින් සුජාතා චිත්‍රපටය නිපදෙව්වේ ය . එම අඩි පාරේම යමින් ඇස් ඇම් නායගම් ද චිත්‍රපට නිෂ්පාදනය කළේ ය.

1956 දී ඩිංගිරි මැණිකා චිත්‍රපටය නීතීඥ ඇස් ඩී ඇස් සෝමරත්න ද සුරඟනී චිත්‍රපටය සිරිල් බී අබේරත්න ද නිපදවනුලැබූ නමුත් මේ සියලු චිත්‍ර පට වල දකින්නට ලැබුණේ දකුනු ඉන්දියානු ලක්ෂණ පමණකි. මේ කාලය වනවිට නැවතත් සිංහල චිත්‍රපට ශිල්පීන්ට



මර්සලින් ජයකොඩි පියතුමා

ඉන්දියානු චිත්‍රපටකරුවන්ගේ බලපෑමට යටත් වීමට සිදු විය. විවිධ රුචිතක්වයන් ඇති නරඹන්නන් ඒවා බලා තම නැණ පමණින් සතුටු විය.

මේ සියලු දෙනා අභිබවා අපේ කම රැගත් චිත්‍රපට කලාවක් බිහි කිරීමට ඇප කැප වූ සිනමා ශිල්පියා ලෙස ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා 1956 නිපදවූ රේඛාව චිත්‍රපටය හැඳින්විය හැකි ය. මෙපමණ කලක් චිත්‍රාගාර වලට පමණක් සීමා වී තිබූ සිනමාව ඔහු එලිමහනට ගෙන ඒමට සමත්විය.

එපමණක් නොව දේශීය සංගීත කලාවක් ද දේශීය හුරුවට රචනා වූ ගීතද මෙහි ඇතුළත් විය. සුනිල් ශාන්තයන් ද මර්සලින් එස් ජයකොඩි පියතුමාද මේ සඳහා දායක විය.

මතු සම්බන්ධයි

